# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX    YEAR OF OUR LORD JESUS CHRIST, 2025 APRIL    Issue No. 05


## ශුද්ධවූ බයිබලය

**(මාර්ක් 16:9-16))**

09. උන්වහන්සේ සතියේ පළමුවෙනිදා අලුයම්රෑ වේලේ නැගිටි කල පළමුකොට මග්දලාවේ මරියාට පෙනුණුසේක. ඈ වනාහි උන්වහන්සේ විසින් යක්ෂයන් සත්දෙනෙකු දුරුකරනු ලැබූ තැනැත්තීය.

10. ඈ ගොස් උන්වහන්සේ සමඟ සිටි අය අඬමින් වැලපෙමින් සිටිද්දී ඔවුන්ට දැන්නුවාය.

11. උන්වහන්සේ ජීවත්ව සිටින බවද ඈ විසින් දක්නාලද බවද ඇසූ විට ඔව්හු අවිශ්වාසකළෝය.

12. ඉන්පසු ඔවුන්ගෙන් දෙදෙනෙක් පිටිසරට යන කල උන්වහන්සේ අන්‍යාකාරයකින් ඔවුන්ට ප්‍රකාශවූසේක.

13. ඔව්හු ගොස් අනික් අයට දැන්නුවෝය. ඔව්හු ඔවුන්වත් විශ්වාස නොකළෝය.

14. පසුව උන්වහන්සේ එකොළොස්දෙන කෑමට හාන්සිවී සිටියදී ඔවුන්ට පෙනී, නැගුටුණායින් පසු තමන්වහන්සේව දුටු අයව ඔවුන් විශ්වාස නොකළ නිසා, ඔවුන්ගේ විශ්වාසය නැතිකමටත් සිත් දැඩිකමටත් ඔවුන්ට දොස්තැබූසේක.

15. උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරන්න.

16. අදහාගන්නාවූ බව්තීස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය.

## නැවත නැගිටීමෙන් පසුව තිබෙන්නාවූ බලාපොරොත්තුව!

**THE HOPE BEHIND RESURRECTION!**


(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)




පාස්කු ඉරුදිනෙන් පැවසෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරන කොට ගෙන අපගේ බලාපොරොත්තුව අලුත් කිරීමත් අපගේ වේදනාව හා දුක ප්‍රීතියට හැරීමේ සැමරීමක්ය. එහෙත් අපගේ කාර්ය බහුල ජීවිතයත් අපට තිබෙන්නා වූ සියලුම අර්බුද හා සටන් නිසාත් සමහර විට අපගේ බලාපොරොත්තු අපිට නැතිවී යනවාක් මෙන් පෙනේ. සමහර අවස්ථාවන්වලදී අපගේ ඇදහිල්ල සෙලවෙනු ඇත. තවත් සමහර අවස්ථාවන්වලදී අපගේ දර්ශනය කළු වළාකුලකින් වැසී තිබෙන බව පෙනෙයි. ඔබගේ ජීවිතයේත් මෙවැනි ප්‍රශ්නය සමඟ බලාපොරොත්තු රහිතව සිටිනවා නම් ඔබ තනි වී නොමැති බව තේරුම් ගන්න. යේසුස් වහන්සේගේ ගෝලයින් දෙදෙනෙක් එමාවුස් යන ස්ථානයට ගමන් කරමින් සිටියෝය. (ලූක් 24:13-25) එම අවස්ථාවේදී යේසුස්වහන්සේත් ඔවුන් සමඟ ඇවිදගෙන යනු ලැබීය. උන්වහන්සේ ඔවුන්ගේ ඇදහිල්ල නැවත ඔවුන්ට ලබා දෙමින් ඔවුන්ට බලාපොරොත්තුවක් ලබා දුන්නේය. මෙය අපගේ ජීවිතයට මහත් බලාපොරොත්තුවක්ය. මන්ද මෙය ස්වාමීන්වහන්සේ අපට දෙන බලාපොරොත්තුවක් නිසාය.

### අවිශ්වාසයේ බර!

දූවිල්ලෙන් පිරුණා වූ පාර දිගේ ගෝලයින් දෙදෙනෙක් ඇවිදිමින් ගමන් කළ අතර ඔවුන්ගේ හදවත දුකෙන් හා වේදනාවෙන් පිරී තිබුණේය. ඔවුන් ඉතා අධෛර්යවත්ත ලෙස ගමන් කළෝය. ඔවුන්ගේ සියලු බලාපොරොත්තු යේසුස් වහන්සේ තුළ තබා තිබුණි. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ ඊශ්‍රායල් සෙනගට උන්වහන්සේ මෙසායා ලෙස සිටිමින් දිගු කාලයක් පුරාවටම ඔවුන් මුහුණ දුන්නා වූ කරදරයන්ගෙන් ඔවුන්ව මුදවන බවයි. නමුත් දැන් යේසුස්වහන්සේව කුරිසිපත්


3 වෙනි පිටුවට ...





Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



## from your dearly beloved brother...

REACHING NATIONS



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**HON. EDITOR-IN-CHIEF**
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
**EX MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.
**GENERAL MANAGER**
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
**ADMINISTRATION**
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
**EDITORIAL BOARD**
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.
**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
**E.MAIL**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
**YOUTUBE CHANNEL**
Echo of His Call

"මක්නිසාද මේ දෙවියන් වහන්සේ සදා කල්හිම අපේ දෙවියන් වහන්සේය. උන්වහන්සේ මරණය දක්වා අපට මග පෙන්නන සේක." (ගීතාවලිය 48:14)

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

අපගේ ස්වාමින් සහ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට සුබ පතමි! *"......... මක්නිසාද උන්වහන්සේ යහපත්ය; උන්වහන්සේගේ කරුණාව සදාකල් පවතින්නේය........" (2 ලේකම් 7:3)*

දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම කරණ කොටගෙන 1969 වර්ෂයේ සිට පුරා වසර 55 ක් මෙම සේවය සම්පූර්ණ කිරීමට උන්වහන්සේ අපට උපකාර කළේය. අපගේ මෙම සඟරාවේ පාරිපාලක කර්තෘ වන අපගේ පුත්‍ර වූ ඇලෙක්ස් සැම්සන් සැම් අප හා සමග සිටගෙන අත්වැල් බැඳ මෙම සේවය දිගටම කරගෙන ආවේය. ඔහුගේ දිවිම ඔහු කෙළවර කරමින් 2025.02.13 වන දින ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වයට ගියේය. වසර 30 ක ඔහුගේ සේවය නිසාත් ඔහුගේ ජීවිතය නිසාත් අපි දෙවියන්වහන්සේට ස්තුති කරන අතර අපි ඔහුව නැවත මුණගැසෙමු. අපව උදෙසා යාච්ඤා කරන්න.



*Sister Angeline Selvakumari*

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 56 වන සංවත්සරය අගෝස්තු මස 8,9,10 යන දිනයන්හිදී සංදෝෂපුරම් හී තිබෙන අපගේ පාසලේ ක්‍රීඩා පිටියේ දී පවත්වමු. මෙම දේව මෙහෙයට විශේෂ දේවදාසයින් පැමිණෙනු ඇත. ඔබද අප හා සමග මෙම උත්සවයට එක්වන්න කියා අපි ඔබට ආරාධනා කරමු.

අපගේ දියණිය වන සහෝදරී එන්ජලින් සෙල්ව කුමාරි අපගේ කාර්යාලයේ ප්‍රධාන පරිපාලක නිලධාරිනිය ලෙස පත්කර තිබෙන බව අප ඉතා සතුටින් ඔබට දැනුම් දීමට කැමැත්තෙමු. ඔබ සියලු දෙනාගේත් අපගේ කණ්ඩායමේත් සම්පූර්ණ සහයෝගය ඇයට ලබා දෙන පිණිසත් ඇය උදෙසා දිගටම යාඥා කරන්න කියාත් ඉතා ආදරයෙන් ඉල්ලමි.

## යෝෂුවා ජාත්‍යන්තර රණශූරයින්

පසුගිය වසර තුනක් පුරා මෙම සේවය පහත සඳහන් සේවාවන් හි යෙදී සිටියේය.

### 1). තරුණයින් සහ දරුවන් උදෙසා ගෝලීය දර්ශනය.

සෑම දිනකදීම රාත්‍රී 10.00 ට විවිධ රටවල්ද සමග මෙම කාරණය උදෙසා අපි යාච්ඤා කරමු. ඔබද මේ උදෙසා යාච්ඤා කරන්න කියා උනන්දු කරමු:

***"ස්වාමිනි, මේ ලෝකයෙහි සිටින්නාවූ සෑම තරුණ තරුණියන් හා දරුවන්ව කරුණාවෙන් සිහිකරන්න."***

මෙම වසරේ දී අපගේ සභාවන්වල සිටින්නා වූ තරුණ තරුණියන් අතර දෙවියන් වහන්සේ ඉතා පුදුමාකාර ලෙස බලවත් දේ කරයි. ඔබටත් අපහා සමග එක්වීමට හැකිය. සෑමදාම රාත්‍රී 10.00 ට ඔබ සිටින ස්ථානයේම සිටිමින් මේ උදෙසා යාච්ඤා කරන්න.

### 2). පැය 24 දම්වැල් යාච්ඤාව

මුළු ලෝතලයෙහිම පිබිදීමක් පැමිණෙන්නය කියා සෑම දිනකදීම එනම් පැය 24 ක් පුරාම අප දම්වැල් යාච්ඤාවක් කිරීම ආරම්භ කර තිබේ. ඔබටත් මෙයට සහභාගී වීමට අපි ආරාධනා කරමු. ඔබ අපහා සමග යාච්ඤාවට එක්වීමට කැමති නම් ඒ සඳහා වේලාවක් එනම් එක් පැයක් වෙන්කර යාච්ඤා කරන්න. ඒ සඳහා ඔබගේ නම සහ දුරකථනය අංකය අප වෙත එවන්න.

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ YouTube Ministry ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development



Sister Andrea
Christmas Henry

**3). සම්මේලන කඳවුරු සහ වැඩමුළු.**

ළමුන් සහ තරුණයෙන් උදෙසා අපි විශේෂ පුහුණුවීමේ වැඩමුළු සහ සම්මේලන පවත්වමු. මෙයට සභා භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට සහභාගී වීමට හැකිය. ඔබ මේ සේවය උදෙසා යාච්ඤා කිරීමට කැමති නම් හෝ එයට සහභාගී වීමට කැමතිනම් අප ඔබටද ආරාධනා කරමු. මේ සඳහා කිසිදු මුදලක් අප අය කරන්නේ නැත. සහෝදරී ඇන්ඩ්‍රියා ක්‍රිස්මස් හැන්ඩ් මේ සේවය භාරගෙන කටයුතු කරයි.

**ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේශන් පාසල සහ නෙහෙමියා බයිබල් විදුහල.**
**ස්තුතියි කිරීම සහ අගය කිරීම**

කැඳවීමේ ප්‍රතිරාවය සේවයෙහි යෙදී සිටින සියලු කණ්ඩායම් නිසාත් සියලු කතෘවරුන් හා පරිවර්තකයෙන් නිසාත් උපකාර සේවයෙහි යෙදී සිටින සියලු දෙනා නිසාත් කාර්යාලයේ සේවකයන් හා මුද්‍රණාලයේ සේවය කරන අය නිසාත් සෑම මසකම භාෂා 16 කින් මෙම සඟරාව නිකුත් කිරීමට උදව් උපකාර කරන්නාවූ සාමාජිකයින් 75 දෙනෙක් පමණ සිටියි. මේ අයට ඔබගේ යාච්ඤාව ඉතා අත්‍යවශ්‍ය වෙයි.



Rev. Dr. John
Rajarathnam

මෙම සේවාවන්වල සිටින අයට අමතරව ඉතා විශ්වාසවන්තව විවිධ සේවාවන්වල යෙදී සිටින එනම්; අපගේ ප්‍රධාන සභාවේ හා ශාඛා සභාවන්වල සිටින්නා වූ දේවගැතිවරුන්, ළමා සේවයේහි යෙදී සිටින්නාවූ ගුරුවරුන්, යාච්ඤා සේවයෙහි යෙදී සිටින්නාවූ නායකයින්, තරුණ සේවයෙහි යෙදී සිටින්නාවූ නායකයින් සහ ගෘහ යාච්ඤා කණ්ඩායම්වල සම්බන්ධීකාරකවරුන් යන සියලු දෙනා උදෙසා ඔබගේ යාච්ඤාව අපි ඉල්ලා සිටිමු.

එමෙන්ම, උන්වහන්සේගේ සෙනඟගේ සියලුම අවශ්‍යතාවයන් සපුරා දෙන්නය කියා ඇදහිල්ලෙන් අපි යේසුස් වහන්සේ ඉදිරියෙහි සිටගමු. එසේම අප මනුෂ්‍යයන්ගේ බලය මත නොව දෙවියන් වහන්සේගේ සැපයීම තුළ රඳා පවතිමු. තවද ඔබ සැමදෙනාම අප හා සමග එකතුවී මේ සේවයෙහි පංගුකාරයන් වන්න.ස්වාමීන්වහන්සේගේ සේවය ගොඩනැංවීමට ඔබත් හවුල්කාරයෙන් වන්න. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා!

In His Service,
*ECHO OF HIS CALL FAMILY.*

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

කළාට පසුව උන්වහන්සේගේ මළවුන්ගේ නැගිටීමේ කතාව සියලු දෙනා අතරම පැතිර ගියේය.

එබැවින් ඔවුන් යේසුස්වහන්සේ තමන් සමඟ නොමැති කියා සිතමින් ඉතා වේදනාවෙන් සහ සැකයෙන් ගමන් කරනු ලැබීය. ඔවුන් ඇවිදිමින් යන විටදී තවත් අමුත්තෙක් ඔවුන් හා සමඟ එකතු විය. යේසුස්වහන්සේම ඔවුන් සමඟ ගමන් කළ නමුත් ඔවුන් උන්වහන්සේව හඳුනාගත්තේ නැත. යේසුස්වහන්සේ ඔවුන් හා සමග ගමන් කරමින් ඔවුන්ගේ සාකච්ඡාවට ඇහුම්කන් දුන්නේය.

තවද ඔවුන් දෙදෙනා උන්වහන්සේට තමාගේ හදවත තුළ තිබූ දුක, වේදනාව හා කැළඹිලිකාර තත්ත්වයන් ප්‍රකාශ කළේය. යේසුස් වහන්සේ ඉතාම ඉවසීමෙන් එයට ඇහුම්කන් දුන්නේය. පසුව උන්වහන්සේ ප්‍රේමයෙන් ඔවුන්ට තරවටු කළේය.

***"......අඥානයෙනි අනාගතවක්තෘවරුන් විසින් කියන ලද සියල්ල විශ්වාස කරන්නට ප්‍රමාද සිත් ඇත්තෙනි," (ලූක් 24:25)***

දෙවියන්වහන්සේගේ වචනය ඉතා තද නොවූවත් දේව වචනය තුළ තිබූ පොරොන්දු උන්වහන්සේ ඔවුන්ට ප්‍රේමයෙන් මතක් කර දුන්නේය. තවද සෑම අනාවැකියකම යේසුස් වහන්සේ ගැන පවසන බවත් උන්වහන්සේ ඔවුන්ට පැහැදිලි කර දුන්නේය. අපි අපගේ ජීවිතයේත් මේ ගෝලයෙන් දෙදෙනා මෙන් දෙවියන් වහන්සේගේ පොරොන්දු දන්නා නමුත් පීඩා හා කරදර පැමිණෙන විටදී අපි උන්වහන්සේගේ පොරොන්දු දෙස නොව අපගේ ඇදහිල්ලේ අඩුපාඩු කම් නිසා අප අධෛර්යයට පත්වෙමු. නමුත් දෙවියන් වහන්සේගේ වෙනස් නොවන්නා වූ සැබෑ දේ සඳහටම පවතිනු ඇත සමහරවිට අප උන්වහන්සේව හඳුනන්නේ නැතිවෙන්න පුළුවනි. නමුත් යේසුස් වහන්සේ අප හා සමග ඇවිදියි. උන්වහන්සේ ඉවසීමෙන් යුතුව අපගේ ජීවිතයට එළිදරව් කිරීමට බලාපොරොත්තු වෙයි.

## අපගේ මහත් සැනසිලිකාරයාණන් වූ යේසුස්වහන්සේ!

එම්මාවුස්ට ගමන් කරමින් සිටි ගෝලයින් මුණගැසීමට යේසුස්වහන්සේ ගියේ ඇයි? උන්වහන්සේගේ ගෝලයින්ට උන්වහන්සේ කවුද කියා එක විටම උන්වහන්සේ එළිදරව් නොකළේය. නමුත් උන්වහන්සේ ඔවුන් සමඟ ඇවිද්දේය. ඔවුන්ගේ දුක හා වේදනාවට ඇහුම්කන් දුන්නේය. උන්වහන්සේ මෙහිදී අපට පෙන්වන්නේ, අපගේ හදවතේ තිබුන දුක වේදනාව උන්වහන්සේ දන්නා බවයි. අපගේ සිත කැඩුනාවූ වේදනාකාරී ස්ථානයකදී පවා උන්වහන්සේ අප වෙතට පැමිණෙයි. නමුත් එක් රාත්‍රියකදීම අපගේ වේදනාව හා අධෛර්යය ඉවත් වන්නේ නැත. නමුත් උන්වහන්සේගේ

ප්‍රේමයත් අභිමුකත්වයත් උන්වහන්සේගේ සුව කිරීමේ බලයත් උන්වහන්සේගේ සැබෑකමත් අපව සනසන සේක.

ඔබට නැතිවූ කාලවල් ගැන ඔබ සිතා බලන්න. ඔබගේ ජීවිතයෙහි ඔබ මුහුණ දුන්නා වූ වේදනාකාරී අත්දැකීම්, ඔබගේ රැකියාව අහිමිවීම්, එසේ නැතිනම් ඔබට ඇති වූ පරාජිත තත්ත්වයන් වැනි අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේ නිහඬව සිටින්නේ ඇයි? කියා ඔබ සිතනු ඇත. නමුත් සත්‍යතාවය නම් උන්වහන්සේ සෑම විටම එතැන සිට ඔබ සමඟ උන්වහන්සේ ඇවිදිමින් ඔබට කතා කරයි. තවද ඔබ දෙවියන් වහන්සේව හඳුනාගන්නා තුරු උන්වහන්සේ ඔබ අසලින්ම සිටින්නට කැමතියි. අපගේ සියලු බර හා වේදනාවන් උන්වහන්සේ වෙතට භාරදී ඒවා සියල්ලම උන්වහන්සේ අභිමුඛත්වයෙහි තැබූ විට අපගේ දුක සතුටට හරවමින් අපිට බලාපොරොත්තුවක් ගෙන දෙයි.

යොහාන් 11:25 හි උන්වහන්සේ මෙසේ පවසයි; ***''....නැවත නැගිටීමද ජීවනයද මමය, මා කෙරෙහි අදහන්නා මල නමුත් ජීවත් වන්නේය.''*** මෙම පොරොන්දු අනාගතයට පමණක් නොව අපගේ ජීවිතයේ අප මුහුණ දෙන සෑම අභියෝගයකටමත් සෑම දවසකටමත් බලපානු ඇත.

## දෙවියන්වහන්සේගේ වචනයේ බලය!

එම්මාවුස්ට ගමන් කරමින් සිටි ගෝලයින් දෙදෙනා ඔවුන්ගේ ගමන දිගටම ගමන් කරමින් සිටි අවස්ථාවේ දී යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේගේ වචනය ඔවුන්ට පැහැදිලි කිරීමට පටන්ගත්තේය. තවද සෑම අනාවැකියක්ම ඉෂ්ට වූ බව ඔවුන්ට එළිදරව් කර පෙන්නමින් මෝසෙස්ගේ කාලයේ පටන් දාවිත් ගීතවලිය ලියූ කාලය දක්වා ස්වාමීන් වහන්සේගේ දුක් විඳීමත් උන්වහන්සේගේ මහත් මහිමයත් ඔවුන්ගේ සාකච්ඡාව තුළ පැහැදිලි කළේය. උන්වහන්සේ දේව වචනය ඔවුන් හා සමග බෙදා ගන්නා විට එය ඔවුන්ගේ හදවතට දැවීමක් ඇති කර බලපෑමක් ඇති කරනු ලැබුවේය කියා ප්‍රකාශ කරනු ලැබුවේ එමනිසාය. ගෝලයෙන් මෙසේ පැවසුවේය. ***''..... උන්වහන්සේ අප සමග මඟ දී කතා කළ කල්හිත් ලියවිලි අපට තෝරාදුන් කල්හිත් අපගේ සිත් දැවා නොවේදැයි එකිනෙකා කතා කර ගත්තෝය." (ලූක් 24:32)***

## නැවත නැගිටීමේ පොරොන්දුව සහ ජීවමාන වචනය

බයිබලය අතීතය ගැන කතා කරනවට වඩා ජීවමානව අපට මගපෙන්වන්නා වූ අපගේ හදවතට අදටත් කතා කරන්නාවූ ජීවමාන වචනයයි. (හෙබ්‍රෙව් 4:12) දෙවියන්වහන්සේගේ වචනය තුළට අපගේ හදවත යොමු කරන විට, අප දෙවියන් වහන්සේගේ සත්‍යතාවය දැනගත් විට අපගේ සැකය හා බිය යන සියල්ලම පහවන සේක. ගෝලයින්ට ශාරීරිකව යේසුස් වහන්සේගේ අභිමුඛත්වය ඔප්පු කිරීමට අවශ්‍යතාවයක් නොවුවත් දෙවියන් වහන්සේගේ වචනය තේරුම් ගත් විට ඔවුන් දේව අභිමුඛත්වය කුමක්ද කියා තේරුම් ගත්තේය. එමනිසා දේව වචනය ඇසූ විට; ''අපගේ හදවත දැවී ගියාය.'' කියා කියනු ලැබුවේය.

රෝම 6:4 වන පදය අපි මෙනෙහි කරමු; ***''එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේගේ මහිමය කරණ කොටගෙන මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවා සේම, අපිත් ජීවනයේ අලුත්කමෙන් හැසිරෙන පිණිස මරණය තුළට බව්තීස්මය කරණ කොටගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙමුව."*** උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරනකොට ගෙන අපගේ ජීවිතයට නව ජීවනයක අතිවාරමක් ලැබුණේය. අපගේ ඇතුලාන්තයට නව බලාපොරොත්තුවක් හා විශ්වාසයක් ඇති කරයි. අඳුරු මොහොතකදී පවා අපගේ ආත්මයට බලාපොරොත්තුව හා ධෛර්යය උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම හා උන්වහන්සේගේ වචනය කරනකොට ගෙන අපට ලැබේ.

## මලවුන්ගෙන් නැගිටීමේ පොරොන්දුව!

යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කියා අප සඳහන් කිරීමෙන් අදහස් වන්නේ; පාස්කු ඉරුදින උදෑසන පවත්වන උත්සවාකාර දේව මෙහෙයට පමණක් සීමා කිරීමක් නොවෙයි. අපගේ ඇදහිල්ල සහ දෙවියන් වහන්සේගේ බලය පාපයටත් මරණයටත් ඉහළින් ක්‍රියාකිරීම මළවුන්ගෙන් නැගිටීමේ බලය වෙයි. 1 කොරින්ති 15:20-22 දක්වා පවුලුතුමා මෙසේ පවසයි; ***''නුමුත් ක්‍රිස්තුස් වහන්සේගේ මළවුන්ගෙන් නැගිට සිටිනසේක්මය. උන්වහන්සේ සැතපී ඉන්නන්ගේ නාඹුල් ඵලයය. මක්නිසාද මනුෂ්‍යයෙකු කරන කොටගෙන මරණය පැමිණුන බැවින් මනුෂ්‍යයකු කරන කොටගෙන මළවුන්ගෙන් නැගිටීමත් පැමිණුනේය. මක්නිසාද ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය.'' මෙම පදයෙන් අප ඉගෙන ගන්නේ*** " මරණය අවසානය නොවේය" කියාය. තවද අපට ඇතිවෙන සෝදිසි හා කරදර අපගේ අවසානය නොවෙයි. සොහොනේ බලය බිඳ දමා යේසුස් වහන්සේ මරණයෙන් නැගිටුනාක් මෙන් අපගේ ජීවිතයට පැමිණෙන්නා වූ සියලු බලපෑම්, අමාරුකම් හා අපගේ ජීවිතය පහතට දමන්නා වූ සෑම ප්‍රශ්නවලට ඉහළින් අපට නැවත මළවුන්ගෙන් නැගිටුනාවූ අලුත් ජීවිතයක් තුළ නව බලාපොරොත්තුවක් ඇති කරගෙන ජීවත්වීමට පුළුවනි. ක්‍රිස්තුස් වහන්සේගේ ජයග්‍රහණය කරනකොට ගෙන අපට බලය තිබෙයි. එසේම ඉදිරියට යාමට උන්වහන්සේගේ පොරොන්දු තුළින් බලාපොරොත්තුවක් තිබේයි. අප දකින දේට වඩා අපගේ අනාගතය බලසම්පන්න වන බවට උන්වහන්සේගේ පොරොන්දු අපට තිබෙන නිසා අපි බලාපොරොත්තුව තුළ ජීවත්වෙමු.

## පීඩා මැද බලාපොරොත්තුව!

මළවුන්ගෙන් නැගිටීමේ ආලෝකය කරන කොටගෙන බලාපොරොත්තුව තුළ ජීවත්වීමේදී අපගේ ජීවිතයට පැමිණෙන්නාවූ කරදර සහ අභියෝග නැති වෙයි කියා අප වැරදි ලෙස තේරුම් නොගත යුතුයි. ඒවා අපිට පැමිණීමට පුළුවන. පාවුලුතුමා රෝම 8:18 හි මෙසේ ලියනු ලබයි; ***''මක්නිසාද මේ වර්තමාන කාලයේ දුක් වනාහී අප කෙරෙහි එළිදරව් කරනු ලබන්නා වූ මහිමයට***

....Contd. to page 6

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අප්‍රේ:19-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ සියලුම ක්‍රියාකාරකම්වලට මග පෙන්වීම ලබාදුන් නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:20-** සුදුසුකම් ලත් හා කැපවූ නව අපේක්ෂකයින් අපගේ සංවිධානයට බඳවා ගැනීමට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:21 -** අපගේ සියලුම සහකාර සංස්කාරකවරුන්ගේ ජීවිතය හා ඔවුන්ගේ පවුල් නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:22**- අපගේ සභාවන්ට, ඉරුදින පා, තරුණ සේවයට හා රෝහල් වැඩසටහන්වලට ළඟාවීමට උන්වහන්සේ නොකඩවාම කළ ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:23 -** අපගේ ප්‍රධාන දේව ගැති පාස්ට සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාම දුෂ්ඨ බලවේගයන්ගෙන් ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:24-** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව සහ දේව ධර්ම පාඨමාලාවට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:25-** අපගේ සංවිධානයේ සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කරමින් සියලු දේ සපයමින් ඔවුන්ව ආරක්ෂා කළ නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:26-** අපගේ ප්‍රධාන දේවගැති පාස්ටර් සැම් සෙල්වරාජ්, You-Tube නාලිකාව හරහා බෙදා ගන්නා වූ විනාඩි 5ක පණිවිඩය තුළින් ලබන බලවත් සාක්ෂි නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:27-** 2024 සිට 2025 මුල්‍යමය වර්ෂයේදී දෙවියන්වහන්සේගේ සපයා දීම හා මඟ පෙන්වීම නිසා ස්තුති කරන්න

**අප්‍රේ:28-** භාෂා 16 කින් මුද්‍රණය කරනු ලබන අපගේ මුද්‍රණාලයට සහ ඒවා බෙදා හරිනු ලබන සේවා ස්ථානවලට දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න

**අප්‍රේ:29-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන් ඇඳහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන් හා අපගේ මහා නියෝගයේ හවුල්කරුවන් හා ඔවුන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ කරුණාව ලබා දුන් නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:30-** අපගේ සියලුම දේවස්ථානවල ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමට තරුණ තරුණියන් දිරිමත් කර තිබෙන නිසා හා ශක්තිමත් කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මැයි:01-** අපගේ මිෂනාරි සේවකයින්ගේ නොසැලෙන කැපවීම නිසා ස්තුති කරන්න.

**මැයි:02**- ගෝලීය නොසන්සුන්තාවය සහ යුද තර්ජන මධ්‍යයේ දී සියලුරූම ජාතීන්ගේ දිව්‍යමය ආරක්ෂාව නිසා ස්තුති කරන්න.

**මැයි:03-** දේශපාලනික හා ආගමික විරුද්ධවාදී කම් මධ්‍යයේ වුවද අපගේ කිතුණු සේවාවන් ශක්තිමත්ව තිබෙන නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මැයි:04:** 2025 සිට 2026 වර්ෂය සඳහා අපගේ නේවාසික හා සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විදුහලට සුදුසුකම් ඇති ශිෂ්‍යයෙන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න

**මැයි:05-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේශන් පාසලට 2025 සිට 2026 අධ්‍යයනය වර්ෂණය සඳහා නවක සිසුන් බඳවා ගන්නා පිණිස යාච්ඤා කරන්න.

**මැයි:06-** ලෝකය පුරා විහිදී තිබෙන්නා වූ සභාවන් ආත්ම දිනා ගැනීමට හා පිබිදීමේ අත්දැකීම ලබන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:07-** අපගේ සුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය සහ එහි දෛනික කටයුතු නියමාකාරයෙන් ක්‍රියාත්මක කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**මැයි:08-** අපගේ ආයතනයේ සියලුම සේවකයින්ගේ සමගිය හා සහයෝගය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:09-** අපගේ සහකාර සංස්කාරකවරුන් හා ඔවුන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:10-** අපගේ සේවාවන්වල මූල්‍යමය අවශ්‍යතාවයන් හා ප්‍රතිපාදන ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:11-** අපගේ සේවාවන්වලට සහ මිෂනාරීවරුන්ට එරෙහිව තිබෙන හිංසා හා පීඩාවන් අවසන් වන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:12-** උතුරු ඉන්දියාවේ සිටින මිෂනාරීවරුන්, දෙවියන් වහන්සේගේ සේවකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ට යහපත් සෞඛ්‍යයක් හා ශක්තියක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:13-** ලෝකයට බලපාන අයහපත් කාලගුණික තත්ත්වයට එරෙහිව දිව්‍යමය ආරක්ෂාව ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:14-**- පරාර්ථකාමී ලෙස තම දරුවන්ව පෝෂණය කර ඇති දැඩි කරන්නාවූ මව්වරුන් නිසා යාච්ඤා කරන්න.

**මැයි:15 -** දිගු කාලයක් රෝහල්ගත වී සිටින හා මාරාන්තික ලෙස විවිධ රෝගාබාධ වලට ලක් වී ලෝකය පුරාම වේදනා විඳින්නා වූ රෝගීන් නිසා යාච්ඤා කරන්න.

**මැයි:16-**- ලෝකය මුළුල්ලේම දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඉදිරියට ගෙනයන පිණිස නව දර්ශනයක් හා මග පෙන්වීමක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:17-**- ශුභාරංචිය ළඟා වූ ප්‍රදේශවල ශුභාරංචිය බෙදා ගැනීමට නිර්භීතකම හා මඟ පෙන්වීම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:18-**- අපගේ සේවාවන් වල විවිධ හැකියාවන් වර්ධනය වන පිණිසත් හා ඒවා ව්‍යාප්ත වන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

***සමාන කරනු ලබන්නට නොවටී යයි සිතමි."*** අපට ඇතිවෙන දුක් පීඩාවන් කොපමණ වේදනාවක් වුවත් එය තාවකාලික වෙයි. අපිට පැමිණෙන්ට තිබෙන තේජස දෙස බලාගෙන අප ඉදිරියටම යා යුතුයි. සැබවින්ම අපට ඇතිවෙන පීඩා සියල්ලම අපගේ ඇදහිල්ල මුල් ඇද අපට වර්ධනය වීමට උපකාර කරයි. යාකොබ් 1:2-4 ඇති කොටසින් උන්වහන්සේ අපිව මෙසේ ධෛර්යමත් කරයි. අප අමාරුකම් තුළින් ගමන් කරන විටදී මළවුන්ගෙන් නැගිටීමේ බලය කරණ කොටගෙන අපට බලාපොරොත්තුවක් දී තිබෙන බව මෙහිදී සහතික කරයි. අප තුළ සැඟවී තිබෙන දෙවියන් වහන්සේගේ බලය අපි දැනගෙන සෑම පීඩා තුළින් බලාපොරොත්තුවක් ඇති කරගෙන ක්‍රියා කරමු.

## බලාපොරොත්තුව යථා තත්ත්වයට පත් වූ සැබෑ ජීවිත කතාවකි!

තමාගේ ජීවිතයෙහි සෑම දේම අහිමිවූ කල්හි බලාපොරොත්තුව නැවත ඇතිකර ගත්තා වූ බොහෝ අය ගැන ඉතිහාසයේ සඳහන් වී තිබේ. මෙවැනි කතාවක් මා ඔබට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. 1973 වෙන වර්ෂයේදී හෝරාටියෝ ස්පැෆ් ෆෝර්ට් නමැති පුද්ගලයා තම පවුල සමඟ නැවකින් ගමන් කරන අතරතුරේදී ඔහුගේ දූවරුන් හතර දෙනා නැව් අනතුරකට ලක් වී මිය ගියේය. ඔහුගේ දුක වචන මාලාවකින් ප්‍රකාශ කිරීමට නොහැකි විය. නමුත් ඒ සෑම දේ තුළම ඔහු ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබෙන බලාපොරොත්තුව අත්දැක්කේය.

ඔහු ඔහුගේ භාර්යයාව සමග නැවත නැවෙන් ආපසු පැමිණෙන විටදී ඔහුගේ දියණියන් දියේ ගිලී මිය ගිය ස්ථානය පසු කළේය. නමුත් ඒ සෑම වේදනා මැදින් ඔහු ගීතිකාවක් ලිව්වේය. ''මගේ ආත්මය සෑම විටම සුවයෙන් සිටියි." කියා එහි සඳහන් කර තිබුණේ.

එම්මාවුස්ට ගමන් කරමින් සිටි ගෝලයින් මෙන් ස්පැෆ්ෆෝඩ්ස් ඔහුගේ වේදනාකාරී ගමන තුළ ගමන් කරනු ලැබීය. ඔහුගේ හදවත දුකෙන් පිරී තිබුණත් ඔහුගේ ඇදහිල්ල ස්වාමීන් වහන්සේ තුළ තබා තිබුණි. වේදනා මැද ඔහු දෙවියන් වහන්සේගේ කරුණාව තේරුම් ගත් ආකාරය ඉතාමත්ම අනර්ඝයි.

එම ගෝලයින් දෙදෙනා යේසුස් වහන්සේ රොටී කඩන විටදී උන්වහන්සේව හඳුනා ගත් ආකාරයෙන් ස්පැෆ්ෆෝර්ට් යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරන කොටගෙන ඔහුගේ අඳුරු මොහොතේදී දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ තම ඇදහිල්ල හා බලාපොරොත්තුව නැවත ගොඩනගා ගත්තේය.

## යේසුස් වහන්සේගේ ජයග්‍රහණයෙන් අපි ආලෝකය තුල

යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම මරණයෙන් ජයගත්තාට වඩා එහා ගියා වූ දෙයකි. එය අපගේ ජීවිතය නැවත ගොඩ නඟාගැනීමට දෙන්නා වූ ආරාධනයකි. රෝම 8:37 හී මෙසේ පවසයි;
***''නුමුත් අපට ප්‍රේම කළා වූ තැනන් වහන්සේ කරන කොට ගෙන අපි මේ සියල්ලේ දී අතිශයින්ම ජය ගන්නෝවමුව."*** මළවුන්ගෙන් නැගිටීමේ බලාපොරොත්තුව හා බලය නම් මෙයයි. අපගේ ජීවිතයට පැමිණෙන්නා වූ සෑම අභියෝගවලට මුහුණ දීමට හැකි බලයක් මේ තුළ අඩංගු වී ඇත. මෙය අපගේ ශක්තියෙන් හෝ බලයෙන් නොව ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රේම කළ නිසා අපිට ලැබුණු ජයග්‍රහණයකි. සෑම පරීක්ෂාවකටම අරමුණක් ඇත.

සෑම වේදනාවක්ම දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ප්‍රීතියට හැරෙනු ඇත. එබැවින් අපි ධෛර්යමත් වෙමු. උන්වහන්සේගේ කරුණාව පැළඳ ගනිමු. සත්‍යතාවය තුළ ජීවත් වෙමු. යේසුස්වහන්සේ ගේ මළවුන්ගෙන් නැගිටීමේ එම බලය අප තුළ තවමත් තිබෙයි. එබැවින් බලාපොරොත්තුව සමඟ සාක්ෂිකාර ජීවිතයක් ගතකරන්න. ඔබගේ තත්ත්වය කෙසේ වෙතත් දෙවියන් වහන්සේට නැවත ඔබව ගොඩනැගීමට හැකිය.

## බලාපොරොත්තුව අලුත් කිරීමට කැඳවීමක්!

එම්මාවුස් කතාව ඓතිහාසික වාර්තාවකට වඩා එහා ගියා වූ දෙයකි. එය අප සෑම කෙනෙකුටම පෞද්ගලික ආරාධනාවකි. සැකය හා බලාපොරොත්තු සුන් වූ අවස්ථාවන්වලදී පවා යේසුස් වහන්සේ අප අසලින් ගමන් කරන බව එම කතාවෙන් අපට මතක් කර දෙයි. උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ අපව මුදවන සේක. දැනට අප මුහුණ දෙන්නා වූ ප්‍රශ්න අපට ප්‍රශ්නයක් නොවන්නේය. අපට තිබෙන කුරුසියන් දේව අභිමුඛය තුළ තබා අපේ බලාපොරොත්තුව අලුත් කර ගනිමු.

## එබැවින් මා ඔබව ඔබගෙන් මෙසේ අසමි;

අද ඔබ ඔසවාගෙන යන්නා වූ බර මොනවාද? ඔබ මුහුණ දෙනු ලබන්නා වූ අභියෝග වලදී ඔබ සමග ගමන් කිරීමට ඔබ යේසුස් වහන්සේට ආරාධනා කර තිබේද?

ඔබගේ හැඟීම් වලට, ඔබගේ ඇදහිල්ල හැඩගස්වා ගැනීමට ඉඩ දෙනවාද? නැතහොත් දේව වචනයේ නොවෙනස්වන සත්‍ය මත ඔබ ස්ථිරව සිටිනවද?

මෙම පාස්කු ඉරුදින සැකයෙන් විශ්වාසයටත් බලාපොරොත්තු සුන් වීමෙන් බලාපොරොත්තු වෙතටත් ගමන් කිරීමට තීරණය කර තිබෙනවාද?

ඔබ ආලෝකය දැකීමට සටන් කරමින් පොර පදනවා නම්; දැන් යාච්ඤා කිරීමට මොහොතක් ගන්න. ඔබගේ අමාරුකම් මැදට යේසුස් වහන්සේට පැමිණෙන පිණිස ආරාධනා කරන්න. මන්ද උන්වහන්සේ තම ගෝලයින් සමඟ ඇවිද්දාක් මෙන් ඔබ සමඟද උන්වහන්සේ ඇවිදියි. ඔබගේ බයිබලය විවෘත කර දේව වචනය මෙනෙහි කරන්න. යොහාන් 11:25-26 සහ 1 කොරින්ති 15:20-22 සඳහන් කොටස් මෙනෙහි කරන්න. එම වචනයෙන් ඔබට ස්ථිරත්වයක් දෙනවා ඇත. උන්වහන්සේගේ මළන්ගෙන් නැගිටීම කරනකොට ගෙන ඔබගේ ප්‍රශ්න හා වේදනා කොපමණ ගැඹුරු වුවත් උන්වහන්සේගේ ප්‍රේමය කිසිවිටක වෙනස් නොවන අතර උන්වහන්සේගේ ප්‍රීතිය ඔබට සදහටම දෙන සේක.

## නැවත නැගිටීම මගින් පරිවර්තනය කරන ලද ජීවිතයක් පැළඳගන්න!

අපගේ අනාගතයට පොරොන්දු විශ්වාස කිරීමට වඩා නැවත නැගිටීමේ බලාපොරොත්තුව තුළ ජීවත්වීම

....Contd. to page 8

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE
REACHING NATIONS

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

**Rush for admission!** Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)

**Diploma in Theology**

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

"උන්වහන්සේ කාන්තාරයක් දිය පොකුණක්ද වියළි බිමක් දිය උල්පතක්ද කරන සේක." (ගීතාවලිය 107:35)

1989 වන වර්ෂයේදී අප කුලී නිවසක ජීවත් වූ අතර අපගේ දේව මෙහෙයද එම ස්ථානයෙහි පැවැත්වූවෙමු. ඊට අමතරව අපගේ යාච්ඥාවන් හා උපදේශන මධ්‍යස්ථානය ද C.N.K වීදියේ තිබූ කුලී ගොඩනැගිල්ලෙහි පැවැත්වූවෙමු. නමුත් අප බලාපොරොත්තු නොවූ අන්දමකින් මේ ස්ථානය දෙකෙහි අයිතිකරු එතනින් අපට යන්න කියා පැවසුවේය.

එම කාලයේ දී මා සහ මගේ භාර්යාව රජයේ රැකියාවල නියුතු වී සිටියොමු. අපට ස්ථිර රැකියාවක් තිබූ නමුත් මනුෂ්‍යයන්ගේ උපකාරයක් වත් අපට වියදම් කිරීමට සෑහෙන තරම් මුදල්ද තිබුණේ නැත. අපට ලැබුණු දේ අපි බොහෝ සේවාවන් පවත්වාගෙන යාම සඳහා යෙදවීමට සිදුවිය. අපගේ නිවසත් සභාවත් **කැඳවීමේ ප්‍රතිරාවේ** කාර්යාලයත් වෙන තැනකට ගෙනයාමට අපට මුදල්ද තිබුණේ නැත. මේ සෑම දේටම වඩා මෙම ගොඩනැගිල්ලේ අයිතිකරු සමඟ අප වෙනුවෙන් කතා කිරීමටද කිසිවෙක් සිටියේ නැත. අපගේ දරු දෙදෙනාද මෙම අමාරුකම් වලට මුහුණ දුන්නේය.

මා මෙලෙස ඇවිදිමින් ගමන් කරන විට දී තැරැව්කරුවන් දෙදෙනෙක් හමුවිය. ඔවුන්ට මා මගේ අවශ්‍යතාවය පැවසුවෙමි.

එවිට ඔවුන් මට මෙසේ පවසනු ලැබීය ;

''ඔබට කවුරුත් මෙහේ කුලියට ස්ථානයක් දෙන්නේ නැත. මන්ද ඔබලා ශබ්ද නමින් හාලේලුයා කියා කෑ ගසනවා. එම නිසා අපේ දෙවිවරු ඔබ කරන ක්‍රියාව නිසා කෝප වී අපට දඬුවම් කරනවා " කියා පැවසුවේය.

ඔවුන් මට පැවසූ දෙය මා ගණන් නොගෙන දිගටම ඇවිද්දෙමි. එවිට මට රෝමානු කතෝලික සහෝදරයෙක් හමුවිය. ඔහුට මගේ කතාව මා පැවසූ විට ඔහු මට ඇහුම්කන් දෙමින්;

''සහෝදරයා, එක් පරණ ගෙයක් තිබෙනවා. නමුත් එම නිවසෙහි කාටවත් ජීවත්වීමට බැහැ. මන්ද මීට කලින් එම නිවසෙහි ජීවත් වූ පුද්ගලයා සිය දිවි නසා ගත්තා. ඒ නිසා කිසිවෙක් එහි වාසය කරන්නේ නැහැ. නමුත් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පිරී සිටින නිසා එම ආත්ම පලවා හැරීමට ඔබට හැකි යාව තිබෙන නිසා අඩු මුදලකට එම නිවස ඔබට කුලියට ගැනීමට හැකිය.'' කියා පැවසුවේය. මෙය මට මහත් ප්‍රීතියක් හා බලයක් ගෙන දුන්නේය. නමුත් මට තව බාධාවක් තිබුණි. එනම් එම නිවස සඳහා අතිකාරම් මුදලක් ලබාදීමටවත් මා අතැතිව රුපියල් 50ක් වත් තිබුණේ නැත.

මා නැවත නිවසට පැමිණ දණ ගසා යාච්ඤා කරමින් ''ස්වාමිනි, මට හාස්කමක් කරන්න" කියා යාච්ඤා කළෙමි.

පසු දින උදෑසන මා පුවත්පතක් කියවමින් සිටින විටදී එහි මෙසේ දැන්වීමක් පළවී තිබුණි.

එනම් නිවාස සංවර්ධන අධිකාරිය රජය හා සමග සමඟ එකතු වී රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට නිවෙස් ගැනීමට ණය පහසුකම් සපයනවා යනුවෙනි.

ප්‍රමාද නොවී මා එතැනට ගොස් මගේ අයදුම් පත්‍රය ඔවුන්ට භාර දුන්නෙමි. සාමාන්‍යයෙන් මෙම ණය මුදල ලබා ගැනීමට වසර 5ක් පමණ කාලයක් බලා සිටීමට සිදුවෙයි. නමුත් දෙවියන් වහන්සේගේ කරුණාව කරන කොට ගෙන ඉතා කෙටි කාලයක් තුළදී මට එම මුදල් ලබා ගැනීමට හැකි විය.

මෙසේ අප එම පරණ ගෙදර මුදල් ගෙවා ලබා ගෙන එම නිවසෙහි පදිංචි වූවෙමු. පසුව එම ගොඩනැගිල්ලට අපගේ සභාව හා කාර්යාලයද ගෙන ගියෙමු. කිසිම යක්ෂ ආත්මයක් එහි සිටියේ නැත. දෙවියන් වහන්සේ ඉතා පුදුමාකාර ලෙස ක්‍රියා ක්‍රියා කළේය. අපගේ සභාවේ සේවාවන් පහත මහලයේත් අපගේ කාර්යාලයේ සේවාවන් ඉහළ මහලේත් පවත්වාගෙන ගිය අතර අපගේ නිවස පිහිටා තිබුණේ ද ඉහළ මහලයේය.

වසර කිහිපයකට පසුව එම ගොඩනැගිල්ල කඩා දමා අලුතෙන් ගොඩනැගිල්ලක් සෑදීමට දෙවියන් වහන්සේ අපට උපකාර කරනු ලැබීය. මෙම ගොඩනැගිල්ලෙහි අපගේ සභාව, මුද්‍රණාලය, කාර්යාලය හා අපගේ නිවස යන සියල්ලම එකම ගොඩනැගිල්ලක පිහිටා තිබේ.

1994 වන වර්ෂයේදී මා විශ්‍රාම යන විටදී මා ගත් මුදල මුළුමනින්ම ගෙවා අවසන් කර දැමීමට උන්වහන්සේ උපකාර කළේය. ස්වාමීන්වහන්සේට මා ඉතා ප්‍රීතියෙන් සේවය කරමි.

*''ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්"*
*(ගීතාවලිය 34:8)*

*************

*6 පිටුවෙන්....*

ඉතාම වැදගත් වෙයි. මන්ද බලාපොරොත්තුව ඔබගේ දිනපතා ජීවිතය පරිවර්තනය කරයි. ඔබගේ මාර්ගය පැහැදිලි නැති කල්හි ඔබට ඉදිරියට යාමට ඔබට ඇදහිල්ල අවශ්‍ය වෙයි. ඔබගේ මාර්ගය පැහැදිලි නැතිනම් ඔබගේ ඇතුලාන්තය තුළ තිබෙන තුවාල වලට කමා කිරීමටත් අසීරු දේ කිරීමටත් බලයත් අවශ්‍ය වෙයි. පාවුලුතුමා රෝම 12:2 හි මෙසේ පවසයි; ***''නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන් වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වූ සම්පූර්ණ වූ දේ කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා."*** අපගේ ජීවිතයට පරිවර්තනයක් සිදුවීමට නම්; යේසුස් වහන්සේව මළවුන්ගෙන් නැගිට්ටා වූ එම බලය කරණ කොටගෙන අප තුළ තිබෙන වූ මැරුණු ක්‍රියා මාරු කරමින් අපගේ ආත්මය ශක්තිමත් කරගනිමින් පරිවර්තනයක් වන බව අප තේරුම් ගත යුතුයි.

ඔබගේ ජීවිතයේ ඔබ බොහෝ අභියෝගවලට මුහුණ දී තිබෙනවා ඇත. හැම අමාරුකමක් තවකාලික බව විශ්වාස කරන්න. මෙම සියලු දේ තුළින් ඔබට මාර්ගයක් විවෘත වන බවත් සදාකාලික ප්‍රීතිය අත්වන බවත් දැනගන්න.

# VERY URGENT NOTICE!




There may be some unavoidable difficulty in dispatching **Echo of His Call** by post in the very near future. Therefore, if you are really interested to receive **Echo of His Call** continuously, please send us your names, addresses, E.mail addresses and WhatsApp numbers through letters, emails, phone calls or WhatsApp, SMS messages immediately.

Please help us to serve you continuously.

**Our address:**

**ECHO OF HIS CALL,**
**10, Mohammed Abdullah 2nd Street,**
**Chepauk, Chennai-600 005, India**
**Cell: (+91) 98412 71858 / 98410 71858**
**E.mail: sam@echoofhiscall.org**

නැවත නැගිටීමේ බලය නම් මෙයයි. ක්‍රිස්තුස් වහන්සේව දැන ගැනීම තුළින් පමණක් මෙවැනි ධෛර්යමත් කිරීමක් අපට ලබාගත හැකිය.

මෙවැනි බලාපොරොත්තු ඇති  කිරීමට ප්‍රායෝගික පියවර කීපයක් මා  ඔබට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

## නැවත නැගිටීමේ බලය ඔබගේ දිනපතා ජීවිතයට අත්දැකීමක් කරගන්න.

### 1). දේව වචනය තුළ ඔබව ස්ථිර කරගන්න.

සෑම දිනකදීම ඔබගේ ජීවිතයේ දේව වචනය මෙනෙහි කිරීමට කාල වේලාවක් වෙන්කර ගැනීමට කැපවීමක් කරන්න. ඔබගේ ආත්මයට උන්වහන්සේගේ පොරොන්දු පහත සඳහන් කරන පද අනුව නැංගුරමක් විය යුතුයි. (රෝම 6:4) (යොහාන් 11:25-26) (1 පේතෘස් 1:3)

### 2). යාච්ඤාවට කැපවෙන්න

දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට වේලාවක් වෙන් කරගෙන අවංකව මුළු හෘදයාන්ගේම උන්වහන්සේට කතා කරමින් ඔබගේ බර උන්වහන්සේ ඉදිරියෙහි තබා උන්වහන්සේගේ හඬට ඇහුම්කන් දීමට ඉගෙන ගන්න විට ඔබ කිසිදාක තනි වෙන්නේ නැත.

### 3). ඇදහිලිවතුන් කණ්ඩායමක් සමග එකතුවෙන්න.

ඔබගේ ඇදහිල්ලේ බලාපොරොත්තුව බෙදා ගැනීමට හැකි ඔබගේ ආත්මික ජීවිතය ශක්තිමත් කිරීමට හැකි හා ඔබගේ ඇදහිල්ලේ සාක්ෂිය බෙදා ගැනීමට හැකි දේව දරුවන් කණ්ඩායමක් තෝරාගෙන එම දේව දරුවන් සමඟ ඉතා හොඳ සහභාගිත්වයක් ගොඩනගා ගන්න.

### 4). ඔබගේ ඇදහිල්ල තුළ ජීවත් වෙන්න.

නැවත නැගිටීමේ බලාපොරොත්තුවේ බලයට ඔබගේ ජීවිතයේ දිනපතා ක්‍රියාවන් හැඩගැසීමට ඉඩ දෙන්න.

# උපහාරය



*Pr. Alex Samson Sam*

මගේ කල්‍යාණ මිත්‍රවූ පාස්ටර් සෑම් සෙල්ව රාජ්ගේ එකම පුත්‍රයා වන පාස්ටර් ඇලෙක් සැම්සන් සෑම් 2025 පෙබරවාරි මස 13 වන දින දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල් විය. ඔහු අප හා සමඟ ජීවතුන් අතර නැති නමුත් ඔහුගේ සේවය හා ඔහු ගැන තිබූ සිතුවිලි අපගේ හදවත් තුළ සැමදාම තව පවතිනවා ඇත.

**කැඳවීමේ ප්‍රතිරාවය**

සේවයේ සියලුම කාර්ය මඩුල්ලත් දේව ගැති සෑම් සෙල්වරාජ්ගේ පවුලත් අපගේ හෘදයාංගම ශෝකය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

පාස්ටර් ඇලෙක්ස් සැම්සන් සෑම් ඉතා කරුණාවන්ත යටහත් පහත් මනුෂ්‍යයෙක්ය. ඔහු බොහෝ තරුණ තරුණියන්ව ඔහුගේ ජීවිතය කරන කොටගෙන දෙවියන් වහන්සේ වෙතට ඇද ගත්තේය. **කැඳවීම් ප්‍රතිරාවය** සේවයේ **"යෝෂුවා ජාත්‍යන්තර රණශූරයන්"** යන තරුණ සේවයට ඔහු කළ සේවය ඉතා මහත්තය.

ඔහුගේ වසර 41ක ජීවිත කාලය තුළදී වසර 30ක්ම ඔහු දෙවියන්වහන්සේට සේවය කරනු ලැබීය. ඔහු කිසි දිනෙක ලෝකයේ කාරණාවන් සෙව්වේ නැත. ඔහුගේ සේවය ඉතා කැපවීමෙන් යුතුව ඔහු කරනු ලැබීය. ඔහු කිසිදු විටෙක දොස් පැවරීම් නොකොට ඔහුගේ ශරීරය තුළ තිබූ සියලු වේදනා දරා ගත්තේය.

ඔහුගේ ජීවිතය ගැන හා මරණය ගැන හොඳ අවබෝධයක් ඔහුට තිබුණි:

**සැබෑ තැනැත්තා කිසි විටෙක භය වන්නේ නැත.**
**ඔහු මරණය ජයග්‍රහණයක් ලෙස භාරගත්තේය,**
**ඇදිහිල්ලෙන් ගමන් කරන්නන්ව මරණයට පරාජය කළ නොහැකිය.**

බොහෝ අය මේ ලෝකයේ කාරණාවන් භුක්ති විඳින කල්හි පාලක ඇලෙක්ස් තරම් මමත්වයක් නොමැතිව තමාගේ ජීවිතය දෙවියන්වහන්සේට කැප කරමින් ඇදහිල්ල තුළ ජීවත් වූ බැවින් දෙවියන් වහන්සේ ඔහුට උන්වහන්සේගේ රාජ්‍යය රාජයේ ස්ථිර වූ ස්ථානයක් තබා තිබුණේය. ඔහු අද ස්වර්ගයේ සිටී. ඔහු ගැන තිබෙන්නාවූ සිතුවිලි දුකෙන් නොව බලාපොරොත්තු සහිතව අපගේ හදවත් තුළ සැමදා පවතින්නේය.

ඔහු වෙනුවෙන් අපට කල හැකි ලොකුම උපහාරය නම්; **කැඳවීමේ ප්‍රතිරාවය** සේවය ඔහු කළාක් මෙන් දිගටම පවත්වාගෙන යාමයි. ඔහු අප හා සමඟ ජීවත් වෙයි.

හෘදයන්ගෙන්ම යාඥාව සමඟ,
පී. ශිවප්‍රකාශන සහ   සී. මුත්තුගේ පවුල
(පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ මිත්‍රයින් )



*P. Sivaprakasam*



*C. Muthu*

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

බලාපොරොත්තු රහිතව සිටින අයට කමාවත් කරුණාවත් පෙන්වන්න. ඇදහිල්ලෙන් ඉදිරියට පියවර තබා ඔබගේ ජීවිතයේ බලවත් සාක්ෂියක් හැටියට ක්‍රිස්තුස්වහන්සේගේ බලය ප්‍රකාශ කරන්න. ඇදහිල්ලෙන් පූර්ණ වූ ජීවිතයක් ගතකරන්න.

## ධෛර්යවන්තකම

මෙම පාස්කු ඉරුදින ඔබගේ දුක ප්‍රීතියට හරවන්නා වූ දවසක් විය යුතුයි. සැකයෙන් තොර ඇදහිල්ලෙන් හා බලාපොරොත්තුවෙන් පිරුණා වූ දවසක් විය යුතුයි. යේසුස් වහන්සේගේ නැවත නැගිටීම ඉතිහාසගත කතා වස්තුවක් පමණක් නොව එය ඔබගේ ඇදහිල්ලේ අත්තිවාරමකි. ඔබගේ ජීවිතය තුළ කොතරම් මහත් අන්ධකාරයක් පැවතුණත් දෙවියන් වහන්සේගේ ආලෝකය සදහටම ඔබ කෙරෙහි බැබලෙන බව විශ්වාස කරන්න.

ඔබගේ ගමනේදී යේසුස්වහන්සේ දිනපතා ඔබ සමග ඇවිදින බව විශ්වාස කරන්න. ඔබගේ සියලු බර හා වේදනාවන් උන්වහන්සේට භාර කර උන්වහන්සේගේ ප්‍රේමයත් ජයග්‍රහණයත් අත්දකින්න. දෙවියන් වහන්සේගේ වචනයේ බලයට ඔබගේ හදවත විවෘත කරන්න. දිනපතා උන්වහන්සේගේ මුහුණ සොයා ධෛර්යමත්කමත් විශ්වාසකමත් අත්පත් කරගෙන ස්වාමීන් වහන්සේ කරණ කොටගෙන ජයග්‍රාහකයෙක් වන්න.

*2 කොරින්ති 5:17* ***"එබැවින් යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය: මෙන්න, සියල්ලම අලුත් වී තිබේ."*** මෙම වචනය ඔබගේ ජීවිතය තුළ ක්‍රියා කෙරේවා!

මෙම පාස්කු ඉරුදින දෙවියන් වහන්සේ විසින් ලබා දෙන්නාවූ නව ජීවිතය අත්පත් කරගන්න. ස්වාමීන්වහන්සේ තුළ බලාපොරොත්තුව අත්පත් කරගන්න. ඔබ කිසිදාක යේසුස් වහන්සේට ඉඩදී නොමැති නම් අද දවසේදී ඔබගේ හදවත විවෘත කරමින් උන්වහන්සේට ඉඩ දෙන්න. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න.

ධෛර්යමත් ලෙස අලුත් ජීවිතයක් ගත කරන්න. මෙම පණිවිඩය ඔබටබලාපොරොත්තුවත් දෙවියන්වහන්සේගේ බලයත් හා නැවත නැගිටීමෙන් ලැබූ ආලෝකයත් ඔබට ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරමි.

ආමේන්!

*************

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
on 2nd **APRIL 2025.**

**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**